සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2021 | 10 ශ්‍රේණිය
இரண்டாம் தவணைப் பரீட்சை 2021 | தரம் 10
Second Term Test 2021 | Grade 10

කතෝලික ධර්මය

පැය 3 යි
3 மணி
3 hour

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යයට අයත් පොත් ගණන
 (1) පහකි (2) හතරකි (3) දොළහකි (4) දහසයකි

2. ජනතාවගේ ගැටළු වලට දේව වේදිය දෘෂ්ටියකින් පිළිතුරු දෙන ඓතිහාසික කෘතියකි
 (1) එස්රා (2) ගණන්කතාව (3) එස්තර් (4) උපදේශකයා

3. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත රචනා කරන ලද්දේ,
 (1) ශු. ලූක් තුමා (2) ශු. මාක් තුමා (3) ශු. මතෙව් තුමා (4) ශු. ජොහාන් තුමා

4. ශු. ලූක් තුමා
 (1) පේදුරු තුමාගේ ශ්‍රාවකයෙකි (2) පාවුළු තුමාගේ ශ්‍රාවකයෙකි
 (3) ස්නාවක ජොහාන් තුමාගේ ශ්‍රාවකයෙකි (4) ස්තේපන් තුමාගේ ශ්‍රාවකයෙකි

5. ශු. පාවුළු තුමා විසින්ම ලියන ලද සංදේශයකි,
 (1) ගලාති (2) එපීස (3) තීතස් (4) තෙසලෝනික

6. එළිදරව් සාහිත්‍යයේ 12 සංඛ්‍යාව මගින් සංකේතවත් කරන්නේ,
 (1) විශ්වය (2) පූර්ණත්වය (3) දේවජනතාව (4) ජයග්‍රහණය

7. එළදරව් සාහිත්‍යයේ කතෘත්වය ආරූඪ කර ඇත්තේ,
 (1) ලූක් තුමාටය (2 )මතෙව් තුමාටය (3) මාක් තුමායට (4) ජොහාන් තුමාය

8. එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණයක් නොවන්නේ,
 (1) සංකේත භාවිතය (2) ශුද්ධත්වය (3) ද්විත්වවාදය (4) යුගාන්ත වාදය

9. සලමෝන් රජතුමා පූජාසනය මත යාග පූජා දහසක් පුද කලේ,
 (1) සිනයි කඳු මතය (2) හොරේබ් කඳු මතය
 (3) කාර්මේල් කඳු මතය (4) ගිබියොන් කඳු මතය

10. ප්‍රඥාව සඳහා යෙදෙන හේබ්‍රව් වචනය වන්නේ,
 (1) හොක්මා (2) බරිත් (3) කොහෙන් (4) අදමහ්

11. ජුදා ශ්‍රේෂ්ඨාධිකරණයේදී ජේසු තුමාගෙන් ඇසූ ප්‍රධාන ප්‍රශ්නය වූයේ?
 (1) ඔබ කවුද? (2) ඔබ ක්‍රිස්තුස්ද?
 (3) සත්‍ය යනු කුමක්ද? (4) ඔබ හාස්කම් කරන්නේ කුමන බලයකින්ද?

12. ජේසුස්වහන්ස්ගේ මෘත ශරීරය ගෙන භූමදානය සඳහා ඉදිරිපත් වූයේ,
 (1) සිරේනියේ සීමොන්ය (2) සීමොන් පේදුරුය
 (3) අරමිතියේ ජෝශප්ය (4) නිකදේමුස්ය

13. "එම්මාවුස්" ගමනට සහභාගී වූ ගෝලයන් ස්වාමීන් වහන්සේව හඳුනා ගත්තේ,
 (1) ශු. ලියවිල්ල පහදන විටය (2) රොටී ආශිර්වාදය කරනවිටය
 (3) "ශාන්තිය වේවායි"පවසන විටය (4) ඇලයට අත තබා බැලූ විටය

14. ජුදෙව්වන් විසින් පෙත්ත කොස්ත මංගල්‍ය පවත්වන ලද්දේ,

A - නැඹුල් එල දෙවියන්ට ඔප්පු කිරීමටය
B - නික්ම යාමේ සිදුවීම සිහිකිරීමටයි
C - බැටළුවන් සුරැකීම වෙනුවෙන් තුති පිදීමටය
D - දස පනත ලැබීම සිහි කිරීමටය

(1) A හා C (2) B හා D (3) B හා C (4) A හා D

15. ශු. සභාවේ පළමු ප්‍රාණ පරිත්‍යාගී කිරීටය දිනා ගත්තේ,
(1) ශු. ස්තේපන් තුමාය (2) මහා ජාකොබ් තුමාය
(3) ශු. පාවුළු තුමාය (4) ශු. පේදුරු තුමාය

16. සුළු ආසියාවේ සිට රෝමය දක්වා දහම ව්‍යාප්ත කිරීමේ අසහාය ධර්මදූතයා වූයේ,
(1) ශු. පේදුරු තුමාය (2) ශු. පාවුළු තුමාය
(3) ශු. තෝමස් තුමාය (4 )ශු. ජොහාන් තුමාය

17. ශු. පාවුළු තුමා උපත ලැබුවේ
(1) ජෙරුසලමේය (2) ලුස්ත්‍රාවේය
(3) අන්තියෝකියේය (4) තාර්සසයේය

18. දෙවන ධර්මදූත චාරිකාව පාවුළු තුමා සමඟ සහභාගී වූයේ,
(1) බර්ණබස් හා ලූක් ය (2) බර්ණබස් හා ජොහාන්මාක් ය
(3) සීලස් හා ජොහාන්මාක්ය (4) තිමෝතියස් හා ලූක් ය

19. "ඔබ පොළොවේදී යමක් මුදන්නෙහිද එය ස්වර්ගයේදී මුදනු ලබන්නේය" ජේසුස් වහන්සේ මෙම බලය පවරන ලද්දේ,
(1) පේදුරු තුමාට (2) පාවුළු තුමාට
(3) මතෙව් තුමාට (4) තෝමස් තුමාටය

20. 266 වන ශුද්ධොත්තම පියතුමා කවුද?
(1) ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා (2) 16 වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමා
(3) II වන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා (4) 23 වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා

21. ශු. පේදුරු තුමාගේ සොහොයුරෙකි
(1) ජාකොබ් තුමා (2) ජොහාන් තුමා
(3) ඇන්ඩෘ තුමා (4) පිලිප් තුමා

22. දේව ජනතාව ශුද්ධවන්ත වන්නේ,
(1) ක්‍රිස්තුස්වහන්සේ විද්‍යාමාන කිරීම මතය (2) දෙවියන් වහන්සේට ඇති සම්බන්ධතාව මතය
(3) සාමාජිකයන් අතර පවත්නා එකමුතුකම මතය (4) ධර්ම දූත මෙහෙවරෙහි නියැලීම මතය

23. සුභාරංචිය සියලු දෙනා වෙත ගමන් කරන ප්‍රමාණයට ශු. සභාව
(1) කතෝලික වේ (2) එකත්වයක් වේ
(3) ශුද්ධවන්ත වේ (4) අපෝස්තලික වේ

24. පළමු ධර්මදූත කණ්ඩායම ලංකාවට පැමිණියේ
(1) ක්‍රි.ව. 1505 දීය (2) ක්‍රි.ව. 1522 දීය
(3) ක්‍රි.ව. 1536 දීය (4) ක්‍රි.ව. 1543 දීය

25. බ්‍රිතාන්‍ය යුගයේ දී මෙරටට පැමිණි ධර්මදූත නිකායකි
(1) ප්‍රැන්සිස්කාන නිකාය (2) දොමිනිකාන නිකාය
(3) නිර්මල මරිය නිකාය (4) අගුස්තීන නිකාය

26. දැනට ශ්‍රී ලංකාවේ රදගුරු පදවි සංඛ්‍යාව
(1) 11 කි (2) 12 කි (3) 13 කි (4) 14 කි

27. දේව ප්‍රසාද නිධානයන්ගෙත් ප්‍රසාද නිධානය ලෙස හඳුන්වනු ලබන්නේ
(1) ප්‍රසාද ස්නාපනය (2) පූජකවරය
(3) දිව්‍ය සත්ප්‍රසාදය (4) ආශිර්වාදකාර බන්ධනය

28. සුභාරංචි කතුවරු හතර දෙනාම සඳහන් කරන ප්‍රාතිහාර්යයකි
(1) අංශභාග රෝගියා සුව කිරීම
(2) මුහුද මත ඇවිදීම
(3) ජලය මිදි යුෂට හැරවීම
(4) පුප වැඩි කිරීම

29. ශු. බයිබලයේ සඳහන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳවන ප්‍රථම සළකුණ වන්නේ,
(1) මෙල්කිසාදෙක්ගේ යාගය (2) මන්නා භෝජනය
(3) නුමුහුන් පුප අනුභවය (4) අන්තිම රාත්‍රී භෝජනය

30. ජුදාපාස්කු භෝජනයේ මූලිකාංගයක් නොවන්නේ
(1) පාස්කු බැටළුවා (2) මුහුන් රොටී
(3) තිත්ත පලා (4) මිදි යුෂ

31. දිව්‍ය භෝජනයට සහභාගී වන්නන් ප්‍රේමය පනත ජීවත් කළ යුතු බව ඉගැන්වීමට පාද දෝවනය සිද්ධිය භාවිතා කරන සුවිශේෂකවරයා වන්නේ,
(1) ලූක් තුමාය (2) මතෙව් තුමාය
(3) මාක් තුමාය (4) ජොහාන් තුමාය

32. මරණීය පාපයේ සිටින්නෙකු දිව්‍ය සත් ප්‍රසාදවහන්සේ ලැබීමට පෙර පව් කමාව ලබා ගත නොහැකි නම් ඒ සඳහා කළයුත්තේ කුමක්දැයි සඳහන් කර ඇත්තේ,
(1) සුවිශේෂ ග්‍රන්ථ වලය (2) කතෝලික සභා ධර්මෝපදේශයේය
(3) ශාසන නීති යෙහිය (4 මහෝපදේශ ග්‍රන්ථයේය

33. පුරාණ ගිවිසුමේ වන්දනාවේ කේන්ද්‍රිය ක්‍රියාව වන්නේ,
(1) පුදසුන මත ලේ ඉසීමය (2) කළ පාපවලට මනස්ථාපනය වීමය
(3) සතුන් දෙපලු කිරීමය (4) යාග පූජා පුද කිරීමය

34. අනන්ත වූද, අපරිමිත වූද, සදාතනි කවූද, අමිල යාගය වන්නේ,
(1) කල්වාරි යාගය (2) දවන යාග පූජාව
(3) වන්දි ගෙවීමේ යාගය (4 )දිව්‍ය පූජා යාගය

35. දරිද්‍රතාවයෙන් පීඩා විඳින ජනතාව වෙනුවෙන් "සුබසෙත් ගෙදර" පිහිටුවන ලද්දේ,
(1) තෙරේසා මව්තුමිය (2) මයිකල් රුදිගෝ පියතුමා
(3) දෙවන ජුවාම් පාවුළු පාප්තුමා (4) ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා

36. මරියතුමියගේ ශ්‍රි හෘදයේ හමුදාව සංවිධානය ආරම්භ කරන ලද්දේ
(1) මැක්සිමිලියම් කෝල්බේ පියතුමා
(2) ජුසේවාස් පියතුමා
(3) ෆෙඩ්රික් ඕසනාම් පියතුමා
(4) තෙරේසා මව් තුමිය

37. සෑම පාපයකටම හේතුව වන්නේ,
(1) අප තුල වන උඩගු කමය (2) විශ්වාසයේ මදකම නිසාය
(3) දෙවියන් වහන්සේව නොදන්නා නිසාය (4) දේව වචනය තේරුම් නොගන්නා නිසාය

38. ණය මංගල්‍ය දිනයන් අතරට නොගැලපෙන්නේ
(1) නත්තල් මංගල්‍යය (2) ස්වර්ගාරෝපණ මංගල්‍යා
(3) නිර්මල පිළිසිදීමේ මංගල්‍යය (4) ක්‍රිස්තු රාජාණන්ගේ මංගල්‍යය

39. "දරුවනි ඔබේ දෙමාපියන්ට සමිදානන් වහන්සේ තුළ කීකරුවන්න". පාවුළු තුමා මෙසේ අවවාද කරන්නේ,
(1) කොරෙන්ති ලිපියෙහිය (2) ගලාති ලිපියෙහිය
(3) එපීස ලිපියෙහිය (4) රෝම ලිපියෙහිය

40. එකිනෙකා අතර ප්‍රේමයේ සබඳතාවක් ජනිත කරවන ප්‍රධාන සමාජ සංස්ථාව වන්නේ,
(1) පවුල (2) පාසල (3) දෙව්මැදුර (4) මව්බිම

(ලකුණු 40)

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුලුව තවත් ප්‍රශ්න හතරක් තෝරා ගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) 1. එළිදරව් සාහිත්‍යයට අයත් පොත් දෙක නම් කරන්න.
2. ශු. පාවුළු තුමා හසුන්පත් ලිවීමේ පරමාර්ථ දෙකක් ලියන්න.
3. හේබ්‍රව් ප්‍රඥාවේ ප්‍රභේද 02 ක් නම්කරන්න.
4. උත්ථානවූ ක්‍රිස්තුන්වහන්සේව තම ගෝලයන් දර්ශනය කළ අවස්ථා දෙකක් සඳහන් කරන්න.
5. පේදුරු යන්නෙහි අර්ථය කුමක් ද?
6. නිදහසින් පසු දේශීය කතෝලික සභාව මුහුණ දුන් ගැටළු දෙකක් සඳහන් කරන්න.
7. භෝජනය ලැබීම සඳහා ශාරීරිකව සූදානම් විය යුතු ආකාර දෙකක් ලියන්න.
8. යාග පැවැත්වීමේ පරමාර්ථ දෙකක් ලියන්න.
9. දිව්‍ය පූජාව පැවැත්වීමේ ප්‍රධාන අරමුණු 02 ක් ලියන්න.
10. පුරවැසියෙකුගේ වගකීම් දෙකක් ලියන්න. (ලකුණු 10 x 2= 20)

(02) 1. බලාපොරොත්තුවට විරුද්ධ පාපයන් 02 කුමක් ද?
2. දෙවන පනතට විරුද්ධ ක්‍රියා 03 ක් ලියන්න.
3. ඉරුදින ශුද්ධාවන්තව ගත කිරීමට ඔබට කළ හැකි කාර්යයන් පහක් ලියන්න.

(ලකුණු 2+3+5 = 10)

(03) 1. දිව්‍ය සත්ප්‍රසාදිය ලක්ෂණ 02 ක් නම් කරන්න.
2. දිව්‍ය පූජාව සඳහා භාවිතාවන නම් තුනක් ලියන්න.
3. ඔබ දිව්‍ය සත්ප්‍රසාදීය ජීවිතයේ පංගුකාරයෙකු වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 = 10)

(04) 1. වීර සෙබලා සඟරාව රචනා කලේ කවුද?
2. ගරු මයිකල් රොද්‍රිගෝ පියතුමා විසින් සිදුකල දූත සේවා 03 ක් ලියන්න.
3. ශු. දෙවන ජුවාම් පාවුළු පාප්තුමාගේ ජීවිත යඹබට ආදර්ශයක් වන අයුරු දක්වන්න.

(ලකුණු 2+3+5 = 10)

(05) 1. හතර වන පනතට විරුද්ධ ක්‍රියා 02 ක් ලියන්න.
2. රාජ්‍ය පාලකයින් සතු වගකීම් 03 ක් ලියන්න.
3. නව යොවුන් වියේ සිටින ඔබ තම දෙමාපියන් වෙනුවෙන් යුතුකම් වගකීම් ඉටු කරන ආකාරය සඳහන් කරන්න.

(ලකුණු 2+3+5 = 10)

(06) මාතෘකා දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.
1. ශු. සභාවේ ලක්ෂණ
2. නව ගිවිසුමේ පාස්කු භෝජනය
3. ශු. පාවුළු තුමාගේ ධර්මදූත චාරිකා

(ලකුණු 5 x 2 = 10)